www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ ආන්ඩුව බිඳ වැටීමේ අද්දර

## Sri Lankan government on the brink of collapse

කේ. රත්නායක විසිනි
2005 ජුනි 15

ශ්‍රී ලංකාවේ පාලක සන්ධානයෙන් ඉවත් වීමට ජනතා විමුක්ති පෙරමුන විසින් ඊයේ ගෙන තිබෙන තීන්දුව ආන්ඩුව බිඳ වැටීමේ මුවවිටට ගෙනවුත් තිබෙන අතර රට යලිත් දේශපාලන කලබැගෑනියකට ඇද දමා තිබේ. පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස) මන්ත්‍රීන් 225 ක් වූ පාර්ලිමේන්තුවේ යන්තම් 79 ක කැබැල්ලක් බවට පත් කරනු ලැබ තිබේ. දැන් එය තවදුර රැඳී සිටීම පවතින්නේ එහි චිර කාලීන සතුරා වූ එක්සත් ජාතික පක්ෂ (යූඇන්පීය) එය බිඳ දැමීමට තීන්දු නොකරන තාක් කල් ය.

මෙම දේශපාලන අර්බුදය මැද්දවේ, චන්ද්‍රිකා කුමාරතුංග ජනාධිපතිනිය තම හිටපු සගයන් ''බොරු කීම'' සහ මහජනතාව ''නොමග යැවීම'' පිලිබඳව හෙලාදැකීමට ජාතික රූපවාහිනියෙන් ඉදිරිපත් වුවා ය. ඇගේ පිලිවෙත්වලට බාධා කොට සන්ධාන ගිවිසුම උල්ලංඝනය කිරීමගැන ඔවුන්ට චෝදනා කලා ය. සියලුම පක්ෂ තමාගේ ආන්ඩුවටද එය විසින් පවත්වා ගෙන යන සුනාමි ප්‍රතිසංස්කරන සැලසුම්වලට ද අඩු ගනනේ අවුරුද්දක් සහාය දැක්විය යුතු යයි කී ඇය ඉක්බිති එතරම්ම සියුම් නොවූ තර්ජනයක් කරමින් ''ඒකාධිපතිත්වය සහ මිලිටරි ඒකාධිපතිත්වය'' බොහෝ විට පැන නගින්නේ වර්තමානය බඳු තත්වයන් තුල යයි අනතුරු අඟවා සිටියා ය.

දිවයිනේ විශාල ප්‍රදේශ විනාශභාග් කර දසදහස් ගනන් ජනයා අනාථ කල සුනාමිය සමාජ හා දේශපාලන ආතතීන් පුපුරනසුලු තැනකට ගෙනවුත් තිබේ. ඇමති ධුර අටක් ලබා සිටි ජවිපෙය දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමග එකාබද්ධ සුනාමි ආධාර මන්ඩලයක් නැත හොත් ''ඒකාබද්ධ යාන්ත්‍රනයක්'' පිහිටු වීමේ කුමාරතුංගගේ සැලසුම්වලට විරුද්ධව, ආන්ඩුවෙන් එලියට බැස්සේ ය. ජනතා විමුක්ති පෙරමුන ද, ජාතික හෙල උරුමය ද (ජේඑච්යු) වෙනත් සිංහල ජාතේ‍යාත්තමවාදී සංවිධාන ද සති ගනනාවක් තිස්සේ, යෝජිත ඒකාබද්ධ යාන්ත්‍රනය වෙනම දෙමල රාජ්‍යයක් දෙසට ගත් පියවරයක් යයි ද ජාතිය ''පාවදීමක්'' යයි ද හෙලා දැක්කාහ.

පසුගිය ජුනි 15 දින කුමාරතුංගට අවසන් නිවේදනයක් කල ජවිපෙ ඇය තම යෝජනාව ජුනි 15 දින මධ්‍යම රාත්‍රිය වන විට අතහැර දැමිය යුතුය යි ද එසේ නැත හොත් තමන් ආන්ඩුවෙන් එලියට බසිනු ඇතැයි ද කියා සිටියේ ය.

තමන්ගේ ම අනු ගාමිකත්වය තුල ජාතිවාදී ව්‍යායාමයේ බලපෑම පිලිබඳව චකිත වූ ඇගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයෝ ජවිපෙයට ඉඩ පහසු දීම සඳහා පිටි කොන්ද පසුපස්සට ම නමා ගත්තා හ. අගමැති මහින්ද රාජපක්ෂ ද එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ලේකම් සුසිල් ප්‍රේමජයන්ත ද වෙනත් අය ද ජවිපෙ නයකයන් සමග දිගින්දිගට ම සාකච්ඡා පැවැත් වූහ. එහෙත් ඉන් පලක් වූයේ නැත. අන්තිම විනාඩියේ දී, අවසාන දිනය ජුනි අග වෙනතෙක් හෝ දිග්ගැසී යන ලෙස රාජපක්ෂ ජවිපෙන් ඉල්ලා සිටියේ ය.

එහෙත් කුමාරතුංගට උපාමාරු දැමීමට ඉඩක් තිබුනේ නැත. සඳුදා වොෂිංටනයේ රැස් වූ ලංකාවට ආධාර සපයන ජාත්‍යන්තර කන්ඩායාමේ සභාපති මන්ඩලය වූ එක්සත් ජනපදය, ජපානය සහ නොර්වේ තමන්ගේ පැත්තෙන් අන්තිම නිවේදනයක් නිකුත් කලාහ.

ඔවුන්ගේ ප්‍රකාශය කුමාරතුංගට සහයෝගය දෙන ගමන් ම ''උතුරු නැගෙනහිර සුනාමියට ගොදුරුවූවන්ට ප්‍රතිසාධක ආධාර යථා ආකාර ගලායාම සහතික කිරීම සඳහා වහාම (එල්ටීටීඊය) සමග එකඟතාවයක් අත්සන් කල යුතුය''යි බලකර සිටියේ ය. 2003 අප්‍රේල් මාසයේ දී අනහිට තිබුනු සාම සාකච්ඡා යලි ආරම්භ කරන ලෙස ද එය අවධාරනය කර සිටියේ ය.

මුදල් නැතිව හිරවී තිබෙන එජනිස ආන්ඩුව ආධාර සපයන ජාත්‍යන්තර කන්ඩායම දෙන්නට පොරොන්දු වී තිබෙන ඩොලර් බිලියන තුනක් ලබාගැනීමට වියරුවෙන් සිටී. එපමනක් නොව එය ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ වඩාත් පලල් අර්බුදය ගැන කම්පාවට පත්ව සිටින කොලඹ ධනපති පන්තියේ කොටස්වල පීඩනයට ද හසුව පවතී.

කොලඹ නැෂනල් ඇසෙට් මැනේජ්මන්ට් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා වූ එස්. ජෙයරාමන් බ්ලෝම්බර්ග් වෙබ් අඩවියට මෙසේ ප්‍රකාශ කලේ ය. ''මෙම අරමුදල් ලබා ගැනීමට සුදුසු රාමුවක් ඇතිකර ගත්තේ නැතිනම් ආර්ථිකය අමාරුවේ වැටෙනු ඇත'' රටේ ගැඹුරු වන දේශපාලන අර්බුදය ද යුද්ධය පිලිබඳ තර්ජනය ද ගැන කතා කල හෙතෙම මෙසේ ද පැවැසී

ය. ''ආයෝජන අද්දා ගැනීමට නම් (අපට) සාමයක් අවශ්‍ය ය. එසේ නැත හොත් අප ඇද වැටෙනු ඇත්තේ හැලහැප්පුම් සහිත ගමනකට ය.''

දැන් එක්සත් ජනතා නිදහස් සන්ධානය නපුරු තත්වයකට මුහුන දී සිටී. ඊයේ *ලෝසවෙඅ* විසින් ප්‍රශ්න කරනු ලැබූ කල්හි ජනාධිපති ප්‍රකාශක හරිම් පීරිස්ගේ සහාය නිලධාරියෙකු වූ ගෙහාන් හෙට්ටිගේ මෙසේ කීය: ''ආන්ඩුවට පැවැතීමට ඉඩ තිබේ. එහෙත් වැදගත් නීති සම්මත කරගත නොහැකි වනු ඇත.'' දැන් පාර්ලිමේන්තු මන්දිරය තුල විපක්ෂයේ අසුන් පිරී ඉතිරී ගොසිනි. ඒ නිසා ජවිපෙ මන්ත්‍රීවරුන්ට (විපක්ෂයට ගිය පසු ද) ඉඳගැනීමට සිදුවී තිබෙන්නේ ආන්ඩුව පැත්තේ ය. ජවිපෙ ඉවත්ව ගිය පසු එජනිස ට නැතිවී තිබෙන්නේ පාර්ලිමේන්තුවේ වැඩි ඡන්ද පමනක් නො වේ, එයට ප්‍රාදේශීය සභා හතක පාලනය ද නැතිව ගොස් තිබේ.

බදාදා ජවිපෙයට ලියූ ලිපියක කුමාරතුංග තවමත් ඒකාබද්ධ යාන්ත්‍රනයේ අවසන් ලියවිල්ල සකස් වී නොමැති නිසා ජවිපෙට සන්ධානයෙන් ඉවත්වීමට ''යුක්තියක්'' නැතැයි කියා සිටියා ය. පැහැදිලිව ම ජවිපෙයේ සිත් දිනාගැනීමට උත්සාහ කරමින් ඇය සුනාමි ආධාර යාන්ත්‍රනය හුදෙක් පරිපාලන යාන්ත්‍රනයක් පමනක් නිසා ''රටේ ස්වෛරී භාවය ට හෝ ඒකාග්‍රතාවයට ඉන් හානියක් වන්නේ නැත''යි ද ප්‍රකාශ කර සිටියා ය. එහි වැඩ කටයුතු සීමා වනු ඇත්තේ දිස්ත්‍රික්ක හයක වෙරලේ සිට කිලෝමීටර් දෙකක් පලල් පටියකට ය.

කුමාරතුංගගේ දඟර හා කරනම් පෙන්නුම් කරන්නේ දිවයිනේ ධනේශ්වර පාලනයේ ගැඹුරු අර්බුදය යි. ආර්ථික වශයෙන් ගත් කල්හි, පාලක පන්තිය දිග්ගැසුනු සිවිල් යුද්ධය දිවයින ලාභ ශ්‍රම කඳවුරක් බවට පත් කොට ඉන්දියානු උප මහාද්වීපයට ගලා එමින් පවතින ආයෝජනවලින් පෙත්තක් ලබාගැනීමට බාධාවක්ව පවත්නා දිග්ගැසුනු සිවිල් යුද්ධය අවසන් කරන ලෙස බල කරමින් සිටී. දේශපාලන වසයෙන් ගත්කල්හි, කෙසේ වෙතත් සියලු දේශපාලන පක්ෂ - ශ්‍රීලනිපය ද යූඇන්පිය ද ඇතුලු - සිංහල ජාතෝන්මාදයේ යොදා එහි කරවටක් ගැලී තමන්ට එල්ලවන විරෝධතා අවමංගත කිරීම සඳහා ද කම්කරු පන්තිය භේද කිරීම සඳහා ද යලි යලිත් එය යොදාගත්හ.

එකදු ප්‍රධාන පක්ෂයක් වත් පලල් මහජන සහයෝගයක් නො ලබයි. යූඇන්පී සහ ශ්‍රීලනිප යන පක්ෂ දෙක ම සාමාන්‍ය වැඩකරන ජනතාවගේ ජීවිත මත විනාශකාරී බලපෑමක් ඇති කරන්නා වූ ප්‍රතිව්‍යුහකරන ආර්ථික පිලිවෙත් පැටවීමට වග කිව යුත්තෝ ය. මෙහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රජාගනවාදය සහ ජනතාවාදී පිලිවෙත් මත පදනම් වූ ජවිපෙට ටික කලක් විශේෂයෙන් ම ගම්බද පලාත්වල යම්කිසි බලපෑමක් ඇති කර ගත හැකි විය. එහෙත් ආන්ඩුවකට සම්බන්ධවූ පලමු වතාවේ ම ජවිපෙ සියලු පොරොන්දු බිඳදමා අවුරුද්දක් ඇතුලත ජන සහයෝගය නැති කර ගත්තේ ය.

දෙසැම්බර් 26 සුනාමිය ද එයට ගොදුරු වූවන් දසදහස් ගනනකට ආධාර කිරීමට ආන්ඩුව අසමත් වීම ද මේ සියලු සන්තතීන් උග්‍ර කලේ ය. ඒ සමගම රැකියා කප්පාදුව, පුද්ගලීකරනය, වැඩිවන බඩු මිල සහ ගම්බද සහනාධාර කප්පාදුව නිසා වර්ජන හා විරෝධතා රැල්ලක් කම්කරුවන් හා ගොවීන් අතර ඉස්මතු වී ඇත. ජවිපෙ විසින් යාන්ත්‍රනයට එරෙහිව ගෙනගිය ජාතෝන්මාදී ව්‍යායාමය වනාහී අන් සියල්ලටමත් වඩා විශේෂයෙන් සුනාමියට ගොදුරු වූ දකුනු පලාත්වල තම සමාජ පදනම රැක ගැනීම සඳහා දරුනු වියරු ප්‍රයත්නයකි.

ඒකාධිපතිත්වයේ අන්තරාය පිලිබඳ කුමාරතුංග කරන හැඟවීම ප්‍රකාශනය කරන්නේ පාලක කවයන් තුල පැරනි පාර්ලිමේන්තු පාලන යාන්ත්‍රනයන් වියැකී යාම පිලිබඳව ඇතිව පවත්නා භීතිය ය. ඇයගේ මෙම ප්‍රකාශය වනාහී පාලක ප්‍රභූන් සහ කුමාරතුංග මත් ඒකාධිපති පාලන රූපාකාරයන් දෙසට හැරී ගැනීම සලකා බලමින් සිටින බවට වැඩ කරන ජනතාවට කැරෙන තියුනු අනතුරු ඇඟවීමකි. මෙය ප්‍රථම වතාවට කෙරෙන්නක් නොවේ.

2003 නොවෙම්බර් 1 දා රට එල්ටීටීඊයට පාවාදීමට සැරසීම ගැන එක්සත් ජාතික පක්ෂයේ නායකත්වයෙන් යුතු ආන්ඩුව හෙලා දුටු ජනාධිපතිවරිය තීරනාත්මක ඇමති ධුර තුනක් හිතුවක්කාර ලෙස තමාට පවරාගෙන හදිසි තත්වයක් ප්‍රකාශ කිරීමට ඉදිරියට ගියා ය. ඇය තාවකාලිකව අඩියක් පස්සට ගත්තේ වොෂින්ටනයෙන් හා නව දිල්ලියෙන් ආ ජාත්‍යන්තර පීඩනය යටතේ ය. 2004 පෙබරවාරියේ දී කුමාරතුංග ආන්ඩුව පහකර දමා ජවිපෙ සමග සන්ධානයක් තනා ගෙන අලුතින් ඡන්ද විමසීමක් කැඳවූවා ය. එම ඡන්දයෙන් එජනිස යන්තම් ජයග්‍රහනය කලේ ය.

දැන් කුමාරතුංග අවුරුදු දෙකකට පෙර බලයෙන් පහකර දැමූ එම යූඇන්පිය මත ම රැඳීමට යත්න දරන්නී ය. පසුගිය සඳුදා ජනාධිපතිවරිය හමු වූ එජාප නායක රනිල් වික්‍රමසිංහ ඒකාබද්ධ යාන්ත්‍රනයට සහාය දීමට ද ''මෙම ප්‍රශ්නය උඩ ආන්ඩුව නො පෙරලීමට ද'' පොරොන්දු විය. එහෙත් මෙම පොරොන්දුව අනෙකුත් ප්‍රශ්නවලටත් අදාල නොවනු ඇතැයි ද ඉක්මනින්ම බිඳ වැටෙනු ඇතැයි ද යන්න පිලිබඳ ඇඟැවීම් දැනුදු පහල වී තිබේ.

ඒකාබද්ධ යාන්ත්‍රනය පාර්ලිමේන්තුවේ විවාදයට ගැනීමට ඇය ගෙන තිබෙන තීන්දුව එජාප විසින් දැනට ම විවේචනය කර තිබේ. ඒ පිලිබඳ වගකීම ඇය ම බාරගත යුතු යයි එජාපය කියා සිටී. මේ පිලිබඳව පැවැත්වෙන කුමක් හෝ ඡන්ද විමසීමක දී තම පක්ෂය

ඡන්දයෙන් වැලකී සිටින බවට එජාප කථක ජීඇල් පීරිස් කල ප්‍රකාශ ආන්ඩුවේ ගැටලු තව දුරටත් සංකීර්න කර තිබේ.

ජනාධිපතිවරනය නොවැම්බර් මස පැවැත්විය යුතු යයි ද එජාපය කියා සිටී. එක් වරක් බලයෙන් පහකරනු ලැබූ යූඇන්පීය දැන් සූදානම් වන්නේ පලල් විධායක බලැති ජනාධිපති ධුරය අල්ලා ගැනීමට ය. යූඇන්පී සම ලේකම් තිස්ස අත්තනායක ලෝසවෙඅට කියා සිටියේ තම පක්ෂය ''ආන්ඩුවක් තැනීමට උනන්දු නැති'' බවත් ''එවැන්නක් පලක් නැති'' බවත් ය. ''අප යොමු වී සිටින්නේ ජනාධිපති වරනයට ය''යි ඔහු කීය.

ජවිපෙ ඊයේ පවත්වන ලද ප්‍රවෘත්ති සාකච්ඡාව පුදුමාකාර ලෙස සංයමයෙන් යුතු විය. තම පක්ෂය ආන්ඩුවෙන් ඉවත් වූයේ  බලවත් ''කනගාටුවකින්'' යයි ද ශ්‍රීලනිපය සමග අනාගත සන්ධානයක්  පිලිබඳ තමන් අදහස අත් හැර දමා නැතැයි ද ජවිපෙ නායක සෝමවංශ අමරසිංහ මාධ්‍ය නියෝජිතයන්ට කියා සිටියේ ය. නව සන්ධානයකට කොන්දේසිය වන්නේ ''රටේ ස්වෛරීභාවය සහ ඒකාග්‍රතාවය පවත්වාගෙන යාම ය''යි ඔහු කීය.

ඒ සමගම, කෙසේ වෙතත්, ජවිපෙ ඒකාබද්ධ යාන්ත්‍රනයට එරෙහි ජාතොාත්තමවාදී ව්‍යායාමය උග්‍ර කිරීමට සැරසී සිටී. ඒ සමගම තම විශ්වසනීය භාවය යලිත් ඇති කර ගැනීම සඳහා වැඩවර්ජන මාලාවක් කැඳවීමට එය සැලසුම් කරයි. ගතවූ සතිවල දී ආන්ඩුවේ අන්ඩක් ලෙස ක්‍රියා කල ජවිපෙ පුද්ගලීකරනයට එරෙහිව හා වැඩි වැටුප් සඳහා ඇරඹී තිබුනු වැඩ වර්ජන ගනනාවක් කඩාකප්පල් කලේ ය.

ශ්‍රීලනිප හා එජාප දෙකේම අතෘප්තියට පත්ව සිටින මන්ත්‍රීන්ට තමන් හා ඒකාබද්ධ වන ලෙස ද ජවිපෙ කැඳවා සිටී.

සුනාමියෙන් ක්ෂනික ඉක්බිත්තේ, දිවයින පුරාම වැඩකරන ජනතාව ස්වාභාවිකවම සුනාමියට ගොදුරුවූවන්ගේ ආධාරය සඳහා සිංහල, දෙමල, මුස්ලිම් භේද නොතකා ඉදිරිපත් වූහ. මෙය සමස්ත දේශපාලන සංස්ථාපනයම පිලිබඳව ද, දිවයින තුල දශක ගනනාවක් බලපවත්වා තිබූ ප්‍රජාගනවාදී දේශපාලනය පිලිබඳවත් අවිශ්වාසයක් පෙන්නුම් කලේ ය. මෙම ආවේග දෙක ම සෞඛ්‍ය සම්පන්න විය.

කෙසේ වෙතත්, සුනාමි ව්‍යසනයෙන් මාස 6 කට පසු රට යලි ගොඩ නැගීමක් සිදුවී නැති අතර, පාලක ප්‍රභූ කන්ඩායම් ඒකාධිපති පාලන රූප, ප්‍රජාගනවාදී ප්‍රචන්ඩත්වය, සහ යුද්ධය ඇතුලු තවතවත් ව්‍යසනයන්ට රට ඇද දැමීමට සූදානම් වේ.

මෙම අත්දැකීම විදහා දක්වන්නේ වැඩකරන ජනතාව එක්සත්ව සමස්ත දේශපාලන සංස්ථාපිතයට ම එරෙහිව තම ස්වාධීන පන්ති අවශ්‍යතා සඳහා නිර්දය අරගලයක් දියත් කිරීමේ අවශ්‍යතාවය ය.

© www.wsws.org